**උඩපළාත ප්‍රාදේශීය සභාව - 2021**
**-----------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේවිධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට උඩපළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
---------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)
-------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී,වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනලදවිගණනමතයටපදනමක්සපයාගැනීමේ දී ,වංචාහෝවැරදි හේතුවෙන්,මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකිප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ඇති වීමේඅවදානම්හඳුනා ගැනීමහාතක්සේරුකිරීමසඳහාඅවස්ථාවෝචිතවඋචිත විගණනපරිපාටිසැලැසුම්කරක්‍රියාත්මකකරනලදී.වරදවාදැක්වීමහේතුවෙන් සිදු වනප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්සිදු වනබලපෑමටවඩාවංචාවකින්සිදු වන්නාවූබලපෑමප්‍රබලවන්නේඒවා දූස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විතමඟ හැරීමෙන්,වරදවාදැක්වීමෙන්හෝඅභ්‍යන්තරපාලනයන්මඟ හැරීමෙන්වැනි හේතු නිසාවනබැවිනි.

- අභ්‍යන්තරපාලනයේසඵලදායිත්වයපිළිබඳවමතයක්ප්‍රකාශකිරීමේඅදහසින්නොවූව ද, අවස්ථාවෝචිතවඋචිතවිගණනපරිපාටිසැලැසුම්කිරීමපිණිසඅභ්‍යන්තරපාලනයපිළිබඳවඅවබෝධයක්ලබා ගන්නාලදී.

- භාවිතාකරනලදගිණුම්කරණප්‍රතිපත්තිවලඋචිතභාවය ගිණුම්කරණ, ඇස්තමේන්තුවලසාධාරණත්වයසහකළමනාකරණයවිසින්කරනලදසම්බන්ධිතහෙළිදරව්කිරීම්අගයනලදී.

- මූල්‍ය ප්‍රකාශනවලව්‍යුහයහාඅන්තර්ගතයසඳහාපාදකවූගනුදෙනුහාසිද්ධීන්උචිතහාසාධාරණවඇතුළත්වීඇතිබවසහ හෙළිදරව්කිරීම්ඇතුළත්මූල්‍ය ප්‍රකාශනවලසමස්තඉදිරිපත්කිරීමඅගයනලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේ ද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ දී, මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල කර්මාන්ත ණයගැති හා ණයහිමි ශේෂය රු.423,938 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි | කර්මාන්ත ණයගැති හා ණයහිමි ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,031,425 ක ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී අඩුවෙන් ද, ස්ථාවර තැන්පත් ආයෝජන ශේෂය වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුමේ ගිණුම්ගත කර ඇති බව | ලැබිය යුතු පොළී හා ආයෝජන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |

### 1.6.2 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 04 කට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා උපලේඛනවල ශේෂ අතර රු.10,157,112 ක වෙනසක් පැවතුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී නිවැරදි කරන බව | මූල්‍ය ප්‍රකාශන හා උපලේඛනවල සඳහන් ශේෂ අතර වෙනස්කම් නිවැරදි කළ යුතුය |

1.7 අනුකූල නොවීම්

---

නීති,රීති හා රෙගුලාසි ආදියටඅනුකූල නොවීම්

---

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හාරෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මුදල් රෙගුලාසි 571 | 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අවස්ථා 13 කට අදාළ රු.523,030 ක කල් ඉකුත් වූ කර්මාන්ත තැන්පතු, සම්බන්ධයෙන් ක්‍රියා කර නොතිබුණි. | සභා ආදායමට ගැනීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය |

2. මූල්‍ය සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.33,000,479 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.29,614,163 ක්විය.

2.2 ආදායම් පරිපාලනය

---

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

---

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණපහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් බදු ආදායම රු.2,352,829 ක් අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ ඒකකයක හිඟය රු.5,000 ට වැඩි පාරිභෝගිකයින් 99 දෙනෙකුගෙන් අය විය යුතු රු.862,593 ක් ද, ඒකකයක හිඟය රු.5,000 ට වැඩි වසර 05 ක කාලයක් ඉක්මවා ඇති වරිපනම් ඒකක 79 කින් අය විය යුතු රු.709,986 ක් ද, පාරිභෝගිකයින්ගේ නම වරිපනම් ලේඛනයේ සඳහන් නොවූ “අයිතිකරු” ලෙස පමණක් සටහන් වී ඇති ඒකක 34 කින් අය විය යුතු රු.86,862 ක් ද, රජයේ ආයතන 26 කින් අය විය යුතු රු.59,431 ක් ද ඇතුළත්ව තිබුණි. | හිඟ වරිපනම් මුදලින් කොටසක් අය කර ගෙන ඇති අතර, ඉතිරි හිඟ අය කර ගැනීමට අදාළ ලිපි යොමු කර ඇති බව | හිඟ වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජල බදු<br>--------- | | |
| | සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් හිඟ හිටි ජල ගාස්තු රු.3,095,924 ක් අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ ඒකකයක හිඟය රු.5,000 ට වැඩි පාරිභෝගිකයින් 171 දෙනෙකුගෙන් අය විය යුතු රු.1,230,891 ක් හා ඒකකයක හිඟය රු.5,000 ට වැඩි වසර 05 ක කාලයක් ඉක්මවා ඇති හිඟ ජල පාරිභෝගිකයින් 165 දෙනෙකුගෙන් අය විය යුතු රු.1,199,099 ක් ඇතුළත්ව තිබුණි. | හිඟ ජල බදු අය කර ගැනීමට විසන්ධි නිවේදන යවා ඇති අතර, අය කර ගත නොහැකි ශේෂ සභා අනුමැතියක් මත කපා හැරීමට කටයුතු කරන බව | හිඟ ජල ගාස්තු අය කර ගැනීමට සඳහා කටයුතු කළ යුතුය |
| (ඇ) | කුලී<br>-----<br>කඩ කුලී<br>--------- | | |
| i | සමාලෝචිතවර්ෂයේඅවසානදිනටමූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් හිඟ හිටි කඩ කුලී රු.2,979,594 ක් අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ ඒකකයක හිඟය රු.5,000 ට වැඩි කඩ කාමර 66 ක් සඳහා අය විය යුතු රු.2,842,130 ක් හා ඒකකයක හිඟය රු.5,000 ට වැඩි වසර 05 ක කාලයක් ඉක්මවා ඇති කඩ කාමර 37 කින් අය විය යුතු රු.2,138,578 ක් ඇතුළත්ව තිබුණි. | පුස්සැල්ලාව උප කාර්යාලයේ හිඟ ආදායම් හඳුනා ගැනීමේ ගැටළුවක් පවතින අතර, අනෙකුත් හිඟ මුදලින් කොටසක් අය කර ඇති අතර, ඉතිරි මුදල් අය කර ගන්නා බව | හිඟ කඩ කුලී ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය |
| ii | 2014 වර්ෂයේසිටදිගින්දිගටමපවතිනඅයවියයුතුපැරණිකඩ කුලිහිඟයරු.383,059 ක්වූඅතර, එමමුදලඅයකරගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විස්තරාත්මක තොරතුරු සොයා ගැනීමෙ නොහැකියාව මත අය කර ගැනීමට නොහැකිව පවතින බව | හිඟ කඩ කුලී අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ඈ) | ගෙවල් කුලී<br>------------- | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට වසර 05 ට වැඩි කාලයක සිට හිඟ හිටව පවතින රු.200,934 ක ගෙවල් කුලී අය කර නොතිබුණි. | දීර්ඝ කාලයක සිට පවතින ශේෂයක් වන අතර, අය කර ගැනීම සඳහා තොරතුරු රැස් කරමින් පවතින බව | හිඟ ගෙවල් කුලී අය කර ගත යුතුය |
| (ඉ) | දැන්වීම් පුවරු ගාස්තු<br>--------------------- | | |
| | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන හිඟ හිටි දැන්වීම් පුවරු ගාස්තු රු.3,436,900 ක් අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ එක් දැන්වීම් පුවරුවක හිඟය රු.5,000 ට වැඩි වෙළඳ ව්‍යාපාරවල දැන්වීම් පුවරු 43 ක් සඳහා අය විය යුතු රු.3,430,300 ක් ඇතුළත්ව තිබුණි. | අය කර ගැනීම සඳහා නඩු පැවරීම, සිහි කැඳවීම් යැවීම, සමීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින බව | හිඟ දැන්වීම් පුවරු ගාස්තු අය කර ගත යුතුය |

(ඊ) ත්‍රීරෝද රථ බලපත්‍ර ගාස්තු
------------------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.865,200 ක ත්‍රීරෝද රථ බලපත්‍ර ගාස්තු අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ ඒක් ත්‍රීරෝද රථයක හිඟය රු.2,000 ට වැඩි ත්‍රීරෝද රථ 105 වෙනුවෙන් අය විය යුතු රු.446,400 ක් ඇතුළත්ව තිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය හා ආර්ථික අපහසුතා නිසා, හිඟය වසර මැද දක්වා පෙන්නුම් කරන අතර, ඉදිරියේදී සමීක්ෂණ කටයුතු පවත්වා හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරමි | හිඟ ත්‍රීරෝද රථ බලපත්‍ර ගාස්තු අය කර ගත යුතුය |

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(ඈ) ලැබිය යුතු ගිණුම්** | | |
| සමාලෝචිත වර්ෂයඅවසානයට වසර 05 ක කාලයක් ඉක්මවා තිබුණුඑකතුව රු.5,449,835 ක ලැබිය යුතු ගිණුම් ශේෂ අය කර නොතිබුණි. | කොටසක් අය කර ගත් අතර, ඉතිරිය අය කර ගැනීමට කටයුතු කරන බව | ලැබිය යුතු ගිණුම් ශේෂ අය කර ගත යුතුය |
| **(ඉ) ගෙවිය යුතු ගිණුම්** | | |
| සමාලෝචිත වර්ෂයඅවසානයට වසර 01 සිට වසර 05 අතර කාල පරාසයක් ඉක්මවා තිබුණු එකතුව රු.846,053 ක ගෙවිය යුතු ශේෂ නිරවුල් කර නොතිබුණි. | කොටසක් නිරවුල් කර ඇති බව | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කළ යුතුය |

3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් රු.7,396,495 ක මෝටර් රථයක්, ට්‍රැක්ටර් රථයක් හා යතුරු පැදි 02 ක් 2019, සිට 2021 අතර කාලය තුළ අලුත්වැඩියා කටයුතු සඳහා භාවිතයෙන් ඉවත් කර තිබුණ ද, අලුත්වැඩියා කටයුතු නිම නොකර නිෂ්කාර්යයව පැවතුණි. | අයිතිය පවරා ගැනීමට හා අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව | අලුත්වැඩියා කළ හැකි රථ වාහන අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| සමාලෝචිත වර්ෂයේ අවසානයට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 14 ක පුරප්පාඩු 27 ක් සම්පූර්ණ කර නොතිබුණි. | තාවකාලිකව බඳවා ගැනීම් අත්හිටුවන ලෙස දැනුම් දීම මත පුරප්පාඩු පවතින අතර, පුරප්පාඩු සඳහා දෛනික පදනම මත සේවකයින් බඳවා ගත් බව | අත්‍යවශ්‍ය සේවක පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය |